# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2150/24 - 2019 නොවැම්බර් මස 20 වැනි බදාදා - 2019.11.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඇටම්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජයසිංහගම ප්‍රධාන ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ<br>
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 නොවැම්බර් මස 07 වැනි දින,<br>
බත්තරමුල්ල, පැලවත්ත,<br>
නව පාර්ලිමේන්තු පාර,<br>
''ලක්දිය මැදුර'',<br>
අංක 35හි පිහිටි<br>
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/3/1530

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 56, දෙහිවින්න ග්‍රාම නිලධාරි වසමේ හින්නාරංගොල්ල ගමේ පිහිටි ලියාපදිංචි බලයලත් මිනින්දෝරු විමල් රාජරත්න මහතා විසින් සකස්කරන ලද 2014.12.16 හා අංක 3648 දරන පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ඇටම්පිටිය වත්ත නැමති සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2023 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

කැබලි අංක : 1<br>
ඉඩමේ නම : ඇටම්පිටිය වත්ත<br>
ප්‍රමාණය : හෙක්ටයාර 0.2023


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උතුරට* : අ.ග.පි. 16 හි කැබලි අංක 26V (ඇටම්පිටිය වත්ත) (ඉ.ප්‍ර.කො.සතු. ඉඩම) ;
*නැගෙනහිරට* : අ.ග.පි. 16 හි කැබලි අංක 26V (ඇටම්පිටිය වත්ත) (ඉ.ප්‍ර.කො.සතු.ඉඩම) සහ මෙම පිඹුරේ කැබලි අංක 2 ;
*දකුණට* : මෙම පිඹුරේ කැබලි අංක 2 සහ අ.ග.පි. 16 හි කැබලි අංක 26V (ඇටම්පිටිය වත්ත) (ඉ.ප්‍ර.කො.සතු.ඉඩම) ;
*බටහිරට* : අ.ග.පි. 16 හි කැබලි අංක 26V (ඇටම්පිටිය වත්ත) (ඉ.ප්‍ර.කො.සතු.ඉඩම).

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. සභාපති,
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.

12 - 66

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට බණ්ඩාරවෙල, දියතලාව, හපුතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ දුල්ගොල්ල ජල ගබඩා ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටස්වල නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2019 නොවැම්බර් මස 07 වැනි දින,
බත්තරමුල්ල, පැලවත්ත,
නව පාර්ලිමේන්තු පාර,
''ලක්දිය මැදුර'',
අංක 35හි පිහිටි
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1531

**උපලේඛනය**

බදුල්ල දිස්ත්‍රික්කයේ, බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 66 I, ක්‍රේග් ග්‍රාම නිලධාරී වසමේ ක්‍රේග් වත්ත ගමේ පිහිටි ලියාපදිංචි බලයලත් මිනින්දෝරු නිශාන්ත බුලත්ගේ මහතා විසින් සකස්කරන ලද 2019.07.11 හා අංක 2019/005 දරන සැලසුමේ කැබලි අංක 1 හා 2 ලෙස දැක්වෙන ක්‍රේග් වත්ත ඉහල කොටස ක්ෂේත්‍ර අංක 1 නැමති සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.10114 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් දෙක.

කැබලි අංක : 1
ඉඩමේ නම : ක්‍රේග් වත්ත ඉහල කොටස ක්ෂේත්‍ර අංක 1
ප්‍රමාණය : හෙක්ටයාර 0.08610

*උතුරට* : පූනාගල පාර ;
*නැගෙනහිරට* : තේ වත්ත ;
*දකුණට* : අත්කර ගැනීමට යෝජිත ඉඩමේ කැබලි අංක 2 ;
*බටහිරට* : තේ වත්ත.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ක්‍රේග් වත්ත,
මස්කෙළිය වැවිලි සමාගම.

කැබලි අංක : 2
ඉඩමේ නම : ක්‍රේග් වත්ත ඉහල කොටස ක්‍ෂේත්‍ර අංක 1
ප්‍රමාණය : හෙක්ටයාර 0.01504

*උතුරට* : තේ වත්ත සහ අත්කර ගැනීමට යෝජිත ඉඩමේ කැබලි අංක 1 ;
*නැගෙනහිරට* : තේ කර්මාන්ත ශාලාව සහ තේ වත්ත ;
*දකුණට* : තේ වත්ත ;
*බටහිරට* : තේ වත්ත.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ක්‍රේග් වත්ත,
මස්කෙළිය වැව්ලි සමාගම.

12 - 67

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.